සමූපකාර සේවක කොමිෂන් සභාව (දකුණු පළාත)
கூட்டுறவு ஊழியர் ஆணைக்குழு (தென் மாகாணம்)
Co-operative Employees Commission (Southern Province)
සැලසුම් ලේකම් කාර්යාලයීය ගොඩනැගිල්ල (1 වන මහල), එස්. එච්. දහනායක මාවත, ගාල්ල.
திட்டமிடல் செயலாளர் அலுவலக் கட்டிடம் (1ம் மாடி), எஸ்.எச், தஹநாயக மாவத்தை, காலி.
Planning Secretariat Building (1 st Floor), S. H. Dahanayaka Mawatha, Galle.

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல / My No. } SP/CEC/01/01/05 | ඔබේ අංකය / உனது இல / Your No. } | දිනය / திகதி / Date } 2025.12.15 |

වක්‍රලේඛ අංක 02/2025

දකුණු පළාතේ සියලුම සමුපකාර සමිති සභාපතිවරුන් වෙත,

<u>දකුණු පළාත් සමුපකාර සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය සඳහා බඳවා ගැනීම, දායකත්වය ලබා දීම</u>

2019 අංක 02 දරන දකුණු පළාත් සමුපකාර සේවක විශ්‍රාම වැටුප් ප්‍රඥප්තියේ 09 වන වගන්තිය ප්‍රකාරව උක්ත ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන 2019 අප්‍රේල් මස 01 දින සිට ස්ථිර සේවයට බැඳෙන සමුපකාර සේවකයන් දකුණු පළාත් සමුපකාර සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට දායක වීමට නීතියෙන් බැඳී සිටී. එනයින් දකුණු පළාත් සමුපකාර සංවර්ධන කොමසාරිස් විසින් නිකුත් කර ඇති අංක 02/2025 සහ 2025.12.05 දිනැති වක්‍රලේඛයට සමාන්තරව නිකුත් කරන ලදී.

02. ඒ අනුව ඉදිරියේ දී කොමිෂන් සභාව වෙත පත්වීම් අනුමැතිය සඳහා යොමු කිරීමේ දී යම් තනතුරකට අදාලව බඳවාගනු ලබන සේවකයකු සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු ඇතුළත් වන පරිදි සකස් කළ අධ්‍යක්ෂ මණ්ඩල / කාරක සභා තීරණය , අනුමැතිය සඳහා ඉදිරිපත් කල යුතු සෙසු ලේඛණ සමඟ සමුපකාර සේවක කොමිෂන් සභාව වෙත යොමු කල යුතුය.

- පත්වීම ක්‍රියාත්මක විය යුතු දිනය.
- අදාල වැටුප් පරිමාණය හා වැටුප් පියවර.
- වැටුප් වර්ධක දිනය,
- සමිති වැටුප් ශ්‍රේණිය,
- වැටුප් කේත අංකය.
- උසස් වීමක් නම් පෙර විශ්‍රාම දායක අංකය

2.1 මින් මතු යම් සමුපකාර සේවකයකුගේ පත්වීම ක්‍රියාත්මක වන දිනය එම සේවකයා විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට බැඳුනු දිනය වශයෙන් ද සලකනු ලැබේ.

03. තනතුර අනුමත කිරීමෙන් පසු ඉහත කරුණු ද ඇතුළත් විධිමත් පත්වීමේ ලිපියක් පත්වීම් බලධාරියා වන කාරක සභාව විසින් පෞද්ගලික ගොනුවට පිටපතක් සහිතව නිලධාරියා වෙත නිකුත් කල යුතුය.

04. තනතුර අනුමත කිරීමෙන් පසු දින 90 ක් තුල විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක නොවූ සේවකයන්ගේ තනතුර දැනුම් දීමකින් තොරව අහෝසි වන බවද එම පත්වීම් ලිපියෙහි ඇතුළත් කල යුතුය.

ලේකම් / செயலாளர் / Secretary } 091-2232794 | පරිපාලන නිලධාරි / நிர்வாக அதிகாரி / Administrative Officer } 091-2234279 | කාර්යාලය/ෆැක්ස් / அலுவலகம்/பெக்ஸ் / Office/ Fax } 091-2234383 | වෙබ් අඩවිය / இணையத்தளம் / Web Site } www.cec.sp.gov.lk | විද්‍යුත් තැපැල / மின்னஞ்சல் / E-mail } empcommicoopsp@sltnet.lk

Scanned with CamScanner

05. සමුපකාර සමිතියකට බඳවා ගනු ලබන සේවකයන් සම්බන්ධයෙන් යාවත්කාලීන කරන ලද පුද්ගලික ලිපි ගොනුවක් නඩත්තු කල යුතුය. සමුපකාර සේවකයන් සම්බන්ධ පත්වීම් බලධරයා වන අදාල සමුපකාර සමිතියේ අධ්‍යක්ෂ මණ්ඩලය / කාරක සභාව මෙම පුද්ගලික ලිපි ගොනු පවත්වා ගෙන යාම, ලිපි ගොනු ආරක්ෂාව ඇතුළු ලිපිගොනු නඩත්තුව නිසි පරිදි කාර්යාල ක්‍රම හා අභ්‍යන්තර පාලන ක්‍රමයන්ට අනුගතව සිදු කල යුතුය.

5.1 එකී ලිපිගොනුව තුළ විශ්‍රාම වැටුප් ක්‍රමයට අදාල ලිපි ලේඛණ ද ගොනුගත විය යුතු අතර වාර්ෂික වැටුප් වර්ධක සම්බන්ධ වාර්තාවන්ද ඇතුළත්ව තිබිය යුතුය.

5.2 සෑම සමුපකාර සේවකයෙකුටම සිය පුද්ගලික ලිපි ගොනුව වර්ෂයකට එක් වතාවක් නිරීක්ෂණය කිරීමටත්, එහිදී අනාවරණය වන අඩුපාඩු වේ නම් ඒවා සම්පූර්ණ කර ගැනීමටත් අවස්ථාව ඇත. එබැවින් එකී ලිපි ගොනුව නිරීක්ෂණය කර නිසි පරිදි යාවත්කාලීන කර ගැනීමට සිය සමිති සේවකයන් වෙත උපදෙස් ලබා දෙන ලෙසත්, ඒ සඳහා අවස්ථාව ලබා දෙන ලෙසත්, මෙයින් උපදෙස් ලබා දෙමි. එමඟින් සේවකයා වෙත විශ්‍රාම වැටුප් හිමිකම අප්‍රමාදීව ලබා දීමට හැකිවන බැවින් ඔබගේ ප්‍රමුඛ අවධානය ඒ සඳහා යොමු කල යුතුය.

06. 2019.04.01 දිනට පෙර දකුණු පළාතේ සමුපකාර සමිති වල ස්ථිර සමුපකාර සේවකයන් සම්බන්ධ ව කටයුතු කිරීම.

මෙම විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය ක්‍රියාත්මක වන දිනට සේවයේ නියුතුව සිටි, සමුපකාර සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට දායක වීමට කැමති මේ වන විටත් දායකත්වය ලබා නොගත් සේවකයන් සඳහා සමුපකාර සංවර්ධන කොමසාරිස් විසින් නිකුත් කර ඇති චක්‍රෙල්ඛ පරිදි කටයුතු කරන ලෙස මෙයින් උපදෙස් දෙමි.

එබැවින් ඔබ සමිතියේ එකී හිමිකම ලබන සේවකයන් සිටි නම් හා ඔවුන් මෙම දායක ක්‍රමයට බැඳීමට කැමැත්තේ නම් සමුපකාර සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට දායක වීම සඳහා අවස්ථාව ලබා දීම කෙරෙහි ඔබගේ අවධානය යොමු කරමි.

මෙම චක්‍රලේඛයේ විධිවිධාන 2026.01.01 සිට බලාත්මක කෙරේ. මෙම චක්‍රලේඛය දකුණු පළාත් සමුපකාර සංවර්ධන කොමසාරිස්ගේ ඉල්ලීම පරිදි දකුණු පළාත් සමුපකාර සංවර්ධන කොමසාරිස් විසින් නිකුත් කර ඇති චක්‍රලේඛයට සමාන්තරව නිකුත් කරන ලදී.

කොමිෂන් සභාවේ නියෝගය පරිදි,

බෙනිකා ආර්. ජයසේකර,
ලේකම්,
සමුපකාර සේවක කොමිෂන් සභාව,දකුණු පළාත.

බෙනිකා ආර්. ජයසේකර
ලේකම්,
සමුපකාර සේවක කොමිෂන් සභාව
දකුණු පළාත.

පිටපත්:

1. ලේකම්, කෘෂිකර්ම,ගොවිජන සංවර්ධන .... සමුපකාර අමාත්‍යාංශය - දැ.ගැ.ස
2. සමුපකාර සංවර්ධන කොමසාරිස්/රෙජිස්ට්‍රාර්, දකුණු පළාත - කරු.සමු.සං.ප්‍රා.නි. හරහා අදාල සමිති දැනුවත් කිරීම සඳහා

Scanned with
CamScanner